SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA




# කුමක්ද?

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ගරු කථානායක තුමන් විසින් 2021 සැප්තැම්බර් 21 දින සහතික කර ඇති අතර එදින සිට එය බලාත්මක වේ. ඒ සමඟම 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අවලංගු වී ඇත.

දීර්ඝ කාලයක් තිස්සේ සම්පාදනය කරමින් තිබූ මෙම පනත තුළ වෙනත් රටවල්වල සුරැකුම්පත් වෙළෙඳපොළවල දක්නට ලැබෙන නවතම අංගයන් හා ප්‍රතිපාදන ඇතුළත් වන අතර ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති මූලධර්ම හා ප්‍රමිතීන්ට ද අනුකූල වේ. එමඟින් වෙළෙඳපොළ සංවර්ධනය පහසු වන අතරම ශක්තිමත් නියාමනයකට ද ඉඩ සැළසේ. එසේම ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළෙඳපොළේ වර්තමාන මෙන්ම අනාගත අවශ්‍යතා ද සපුරාලනු ලබයි.



## නව පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය.

වෙනත් රටවල පවත්නා නීති සමඟ කරන ලද සංසන්දනයකින් පසුව නව නීතියක් සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය 2007 වර්ෂයේදී ආරම්භ විය. මෙම වැඩපිළිවෙළට ලෝක බැංකුවේ මෙන්ම ලංකාවේ ප්‍රවීණයන්ගේ ද තාක්ෂණික සහාය ලැබී ඇත. පළමු කෙටුම්පත 2013 දී අවසන් කර ඒ වන විට පැවති කොමිසම විසින් අනුමත කර තිබූ නමුත් එය ඉන් ඉදිරියට ගෙනගොස් නොතිබුණි. එම කෙටුම්පත වැඩිදියුණු කර කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු, 2018 දී පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නමුත් එය විවාදයට ගැනීමට නොහැකි වී ඇත. 2018/2019 කාලය තුළදී එම පනත් කෙටුම්පත තවත් වෙනස්කම්වලට භාජනය කර තිබුණි. නව පනත සකස් කිරීම සම්පූර්ණ කිරීමේ දී, පෙර කෙටුම්පත්වල වල තිබූ මූලික විධිවිධාන රඳවා තබා ගනිමින්, වර්තමාන කොමිසම එම පනත ක්‍රියාත්මක කිරීමේදී දුෂ්කරතාවයන් ඇති නොවන ආකාරයට නොපැහැදිලි තැන් පැහැදිලි කිරීමට පියවර ගෙන තිබේ. මෙම දිගු කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී විවිධ පාර්ශවකරුවන් මෙන්ම මහජනතාව සමඟද දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇති අතර මෙම නීතිය සම්පාදනය කිරීමේදී ඔවුන්ගේ දායකත්වය අතිමහත් වූ බව පිළිගත යුතුය.

## පනතේ ව්‍යුහය

පනත කොටස් හතකින් සමන්විත වන අතර ඒවා පරිච්ඡේද ගණනාවකට බෙදා ඇත. එහි වැදගත් ලක්ෂණයක් වන්නේ එක් එක් කොටස ආරම්භයේදී එම විශේෂිත කොටසේ 'පරමාර්ථය සහ අරමුණ' කුමක්ද යන්න පුළුල් ලෙස විස්තර කර තිබීමයි. එම කොටසේ අඩංගු ප්‍රතිපාදන තුළින් සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන්නේ කුමක්ද යන්න මෙයින් පැහැදිලි වනු ඇත. පනතේ යෙදුම සහ පරමාර්ථය සහ අරමුණ, කොමිසම පිහිටුවීම සහ එහි බලතල, යුතුකම් හා කාර්යයන් මෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ කොමිසමේ කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ආදී මූලික දේ පළමුවන කොටසේ සඳහන් වේ. 'වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන' නමින් හැඳින්වෙන II කොටසේ, කොටස් හුවමාරු, නිෂ්කාශනාගාරයක් සහ මධ්‍යම තැන්පතුගාරයක් ස්ථාපිත කිරීම පිළිබඳව විස්තර කෙරේ. 'සුරැකුම්පත් නිකුත්කිරීම්' නමින් හැඳින්වෙන III වන කොටසින් සුරැකුම්පත් පිළිබඳ පොදු අර්පණයන්, වෙළෙඳපොළ අතරමැදියන් සහ ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීම පිළිබඳව සාකච්ඡා කරයි. IV වන කොටස ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් ගනුදෙනු කිරීම පිළිබඳව විස්තර කෙරෙන අතර 'වෙළෙඳපොළ විෂමාචාරය' නමින් හැඳින්වෙන V කොටසේ තහනම් හැසිරීම් සහ අභ්‍යන්තර තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම ගැන සාකච්ඡා කෙරේ. VI වෙනි කොටසේ කොමිෂන් සභාවේ මුදල් සම්බන්ධ ප්‍රතිපාදන අඩංගු වන අතර VII කොටස මඟින් පනත ක්‍රියාත්මක කිරීම සහ දඬුවම් සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් වැනි පොදු කරුණු අන්තර්ගත වී ඇත.

## නව පනතේ කැපී පෙනෙන ලක්ෂණ

රටේ සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනයේ කාර්යක්ෂමතාව, පුරෝකථනය සහ අනුකූලතාව සහතික කරන බොහෝ වැදගත් ප්‍රතිපාදන නව පනතෙහි අඩංගු වේ. තවද, එමගින් නවීනතම යටිතල පහසුකම් භාවිතා කිරීමට ඉඩ සළසන අතර ආයෝජකයින් හට ඔවුන්ගේ අවදානම් ප්‍රතිලාභ මත පදනම් වන පුළුල් ආයෝජන අවස්ථා තෝරාගැනීමක් සිදුකළ හැකි ආකාරයේ විවිධ ගනුදෙනු උපකරණ හඳුන්වා දීම මෙන්ම නිකුත් කරන්නන් හට ඔවුන්ගේ විවිධ අරමුදල් රැස් කිරීමේ අවශ්‍යතා සපුරා ගැනීමට අවස්ථාවක් සැළසෙනු ඇත.

## වෙළෙඳපොළ සහ වෙළෙඳපොළ ආයතන

වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන සඳහා විශේෂයෙන් වෙන් වූ II කොටස නව පනතේ සැළකිය යුතු කොටසක් වන අතර එහි අඩංගු විධිවිධාන මඟින් මෙම වැදගත් ආයතන සිය කාර්යයන් නිසියාකාරව ඉටු කරන බවට වග බලා ගනී. තවද එමඟින් සුරැකුම්පත් වෙළෙඳපොළ ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියා කිරීම මෙන්ම පද්ධතිමය අවදානම් අවම කිරීමට ද හැකි වනු ඇත.

මෙම විධිවිධාන මඟින් කොටස් හුවමාරුවක, නිෂ්කාශනාගාරයක සහ මධ්‍යම තැන්පතුගාරයක අයිතිවාසිකම් සහ යුතුකම්, බලපත්‍රයක් ලබා

ගැනීමට සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා, බලපත්‍රයක් අවලංගු කළ හැක්කේ කුමන අවස්ථාවකදී ද, මෙම වෙළෙඳපොළ ආයතන වල රීති වල බලපෑම, අධ්‍යක්ෂවරුන් පත් කිරීම, විගණකවරයෙකුගේ කාර්යභාරය ආදිය සඳහන් කර ඇත.

මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවකට තමන්ගේ සුරැකුම්පත් තම හුවමාරුව තුළ ලැයිස්තුගත කළ හැකි වීමයි. මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් (සීසීපී) ලෙස කටයුතු කරන නිෂ්කාශනාගාරයක් සම්බන්ධයෙන් පනතෙහි සඳහන් වන අතර මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් යනු කුමක්ද යන්න එහි පැහැදිලිව නිර්වචනය කර ඇත. තවද, නිෂ්කාශන සාමාජිකයෙකුට තම යුතුකම් ඉටු කිරීමට නොහැකි වූ අවස්ථාවකදී එය සපුරාලීම සඳහා පැහැර හැරීම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ රීති හා ක්‍රියාමාර්ග විස්තරාත්මක ලෙස සඳහන් කර ඇත.

## වෙළෙඳපොළ අතරමැදියන්

නව පනත මඟින් 'වෙළෙඳපොළ අතරමැදියන්' යන්න අළුතින් නිර්වචනය කර ඇති අතර ඊට තවත් පුද්ගල කාණ්ඩ කිහිපයක් එකතු කර ඇති බව ද සැළකිල්ලට ගත යුතුය. 'ආයතනික මූල්‍ය උපදේශක', 'වෙළෙඳපොළ සාදන්නා', 'ව්‍යුත්පන්න තැරැව්කරු' සහ 'ව්‍යුත්පන්න අලෙවි නියෝජිත' යන පුද්ගලයින් ඊට ඇතුළත් කර ඇත. ගැනුම්කරුවන් සහ විකුණුම් කරුවන් අතර සුරැකුම්පත් අඛණ්ඩව හා කාර්යක්ෂමව හුවමාරු කර ගැනීමට උපකාරවීම සඳහා වෙළෙඳපොළ අතරමැදියෙකු වශයෙන් වෙළෙඳපොළ සාදන්නන් හඳුන්වා දීම පෙන්වා දිය හැක.

වෙළෙඳපොළ සම්බන්ධයෙන් මෙන්ම බලපත්‍රයක් ලබාගැනීම හා අළුත් කිරීම සඳහා ඉටු කළ යුතු අවශ්‍යතා, බලපත්‍රයක් ලබා දීම, ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීමට හේතු, වෙළෙඳපොළ අතරමැදියන් විසින් සුරැකුම්පත් ගණුදෙනු කිරීම, විගණකවරයෙකුගේ කාර්යභාරය යනාදි කරුණු වෙළෙඳපොළ අතරමැදි ආයතන සම්බන්ධයෙන් බලපාන්නේ කෙසේද යන්න ඉතා සවිස්තරාත්මකව දක්වා ඇත.

වෙළෙඳපොළ අතරමැදියන් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. වෙළෙඳපොළ අතරමැදියන් වෙළෙඳපොළේ ඉදිරිපෙළ කාර්යභාරයක් සිදු කරන බැවින් සහ ආයෝජකයින් සමඟ සෘජුවම සම්බන්ධ වන හෙයින් ඔවුන්ගේ විශ්වසනීයත්වය සහතික කිරීම අත්‍යාවශ්‍ය ය. මෙය සාක්ෂාත් කර ගැනීම



සඳහා මෙන්ම ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ සේවාවන් කාර්යක්ෂමව ලබා දීම සහතික කිරීම සඳහා, වෙළෙඳපොළ අතරමැදියන් සුරැකුම්පත් සම්බන්ධයෙන් තමන්ට ඇති යම් යම් සම්බන්ධතා හෙළිදරව් කළ යුතු බව සඳහන් කර ඇති අතර යම් ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ස්ථාපිත කර ඒ සම්බන්ධ වාර්තා පවත්වා ගත යුතු යැයි පනත මඟින් නියම කර ඇත. මෙම කරුණු ඔවුන්ගේම අවදානම අවම කිරීම, අනාවරණයන් සහ අනුකූලතාව නිරීක්ෂණය කිරීම උදෙසා හඳුන්වාදී ඇති ප්‍රතිපාදන වන අතර ඒවා අමතර කාර්යභාරයක් හෝ වියදමක් දැරීමට සිදු වන පියවර නොවේ. කලින් කල කොමිසම විසින් හඳුන්වා දෙන ලද රීති හා ප්‍රමිති ස්වරූපයෙන් වර්තමානයේදී පවා එවැනි අවශ්‍යතා දකින්නට ඇත. පෙර පනත හා බලන කල නව පනත මගින් පනත තුළම වෙළෙඳපොළ අතරමැදියන් සම්බන්ධයෙන් නිශ්චිත අවශ්‍යතා ඇතුළත් කර ඇති බව පෙනී යයි.

ආයෝජකයින්ගේ සුභසිද්ධිය සුරක්ෂිත කිරීමේ අරමුණින් හඳුන්වා දී ඇති නව අංගයක් වන්නේ "ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීම" සම්බන්ධ ප්‍රතිපාදනයි.

වෙළෙඳපොළ අතරමැදියන්ට අමතරව, 'සේවාදායකයින් සමඟ ගනුදෙනු කරන සහ වෙළෙඳපොළ අතරමැදියෙකු වෙනුවෙන්' කටයුතු කරන්නන්, ලියාපදිංචි කිරීම සුදුසු යැයි කොමිසම කල්පනා කරන්නේ නම් එය සිදු කිරීමට පනත මඟින් බලය ලැබී තිබේ. මෙම පනත මඟින් ක්‍රියාකාරීන්, භාරකරුවන් සහ තක්සේරුකරුවන් වැනි 'පරිපූරක සේවා සපයන්නන්' ද හඳුන්වා දී ඇති අතර අනාගතයේ දී කොමිසමේ යම් අධීක්ෂණයකට ලක් කළ හැකි නිසා එමඟින් මහජන විශ්වාසය තහවුරු කෙරෙනු ඇත.



## සුරැකුම්පත් නිකුත් කිරීම සහ යහපත් සාංගමික ආචාරධර්ම රැකගැනීම

III වන කොටසෙහි විස්තර කර ඇත්තේ සුරැකුම්පත් නිකුත් කිරීම පිළිබඳ කරුණු වන අතර එහි අරමුණ වනුයේ ලැයිස්තුගත පොදු සමාගම් විසින් කාලානුරූපව මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සහ යහපත් සාංගමික ආචාරධර්මවලට අනුකූල වීමයි.

මහජනතාවගෙන් රැස්කරන අරමුදල් වල වගවීම සහතික කිරීම සඳහා, යම් ආකාරයක පොදු අර්පණයන්ට පෙර ලැයිස්තුගත නොකළ සමාගම් විසින් සිය අනුමැතිය ලබා ගත යුතු යැයි කොමිෂන් සභාව සළකන්නේ නම්, තම අවසරය ලබා ගත යුතු බවට කොමිෂන් සභාව රීති මගින් නියම කළ හැකිය. සුරැකුම්පත් පරිමාව, සුරැකුම්පත් කාණ්ඩය, ආයෝජකයින්ගේ සංඛ්‍යාව සහ වර්ගය, නිකුත් කරන්නාගේ ස්වභාවය හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ ස්වභාවය’ යන කරුණු සැළකිල්ලට ගනිමින් එවැනි අවශ්‍යතාවක් හඳුන්වා දිය හැකිය.

මහජනයාට කරන හෙළිදරව් මත පදනම්ව, යම් වරදක් අනාවරණය වුවහොත්, ලැයිස්තුගත සමාගම් වලින් තොරතුරු ලබාගැනීමට කොමිෂන් සභාවට හෝ වෙළෙඳපොළ ආයතනවලට අයිතියක් ඇත. ‘නිසි විමර්ශනයකින් හෝ පරීක්ෂණයකින් පසු’ ලැයිස්තුගත සමාගම් පනතේ රෙගුලාසි, රීති හෝ නියෝග වල සඳහන් කිසියම් විධිවිධානයක් කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකළ බව සොයා ගත හොත් සුදුසු යැයි සළකන ඕනෑම බලාත්මක කිරීමේ පියවරක් ගැනීමට කොමිසමට බලය ඇත. මෙය කොළඹ කොටස් වෙළෙඳපොළ සහ කොමිෂන් සභාව සිය සාංගමික කටයුතු අංශය මඟින් ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා සිදු කරන අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියේම කොටසක් බව මෙහිදී නැවතත් අවධාරණය කරන අතර අලුත් දෙයක් නොවන බවද සිහිපත් කළ යුතුය. මෙමගින් සිදු කර ඇත්තේ යහපත් සාංගමික ආචාරධර්ම පිළිපැදීම සහතික කිරීම උදෙසා විධිවිධාන පනත තුළම ඇතුළත් කර තිබීමයි.

වෙළෙඳපොළ ආයතනයක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී හෝ ප්‍රධාන නියාමන නිළධාරී තනතුරු බාර ගැනීමට පෙර යම් පුද්ගලයෙකු කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු අතර එවැනි අනුමැතියක් ලබා නොදෙන්නේ කුමන හේතු මතද යන්න පැහැදිලි කර ඇත. තවද, ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා විසින් කොමිසමේ නියමයන් හෝ කොමිසම විසින් අනුමත කරන ලද හුවමාරුවක නියමයන් අනුව යෝග්‍ය සහ නිසි නිර්ණායකයන්ට අනුකූල වීම අවශ්‍ය වේ. තවත් නව විශේෂාංගයක් නම්, ලැයිස්තුගත සමාගම්, වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන්ගේ විගණකවරුන් තම සාමාන්‍ය කාර්යභාරය ඉටු කිරීමේදී ඔහු දැනුවත් වන යම් යම් අක්‍රමිකතා වාර්තා කිරීමට බැඳී සිටීමයි. ඒවා මොනවාද සහ එය වාර්තා කළ යුත්තේ කාටද යන්න විශේෂයෙන් දක්වා ඇත.

එම ආයතන තුළ නිසි සාංගමික පාලනයක් සහතික කිරීම සඳහා සහ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ඔවුන් ඉටු කරන වැදගත් කාර්යභාරය සැළකිල්ලට ගෙන පද්ධතිමය අවදානම අවම කිරීම සඳහා මෙම අවශ්‍යතා හඳුන්වා දී ඇත. මේ වන විට සකස් වෙමින් පවතින සාංගමික පාලන රාමුවේ කොටසක් ලෙස මෙම භාවිතයන් බොහෝමයක් ව්‍යාපාරික ප්‍රජාව විසින් පිළිගෙන ඇති අවස්ථාවක, තම ව්‍යාපාර කටයුතු සුමටව කරගෙන යාමට ඒවා බාධාවක් යැයි සිතිය නොහැක.

## ප්‍රධාන වෙළෙඳපොළ වරදවල්

නව පනතේ V කොටස තුළ ප්‍රධාන වෙළෙඳපොළ වරදවල් විස්තර කරන අතර එය රටේ සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය කිරීම සඳහා ගත් ප්‍රගතිශීලී පියවරක් ලෙස සැළකිය හැකිය.

ප්‍රධාන වෙළෙඳපොළ වරදවල් ඇතුළත් මෙම කොටස “තහනම් හැසිරීම්” සහ “අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම” ඇතුළත් පරිච්ඡේද දෙකකට බෙදා ඇත. තහනම් හැසිරීම් යටතේ වරදවල් පහක් හඳුන්වා ඇත. ඒවා නම් ව්‍යාජ වෙළෙඳාම් කිරීමේ සහ වෙළෙඳපොළ මිල ගණන් කෘතිම ලෙස උස් පහත් කිරීමේ ගණුදෙනු, කොටස් වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම, අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශ, සුරැකුම්පත් ගණුදෙනු කිරීමට වංචනික ලෙස තැනැත්තන් පෙළඹවීම සහ අයුතු ලෙස හැසිරවීමේ සහ රැවටිලි සහගත උපක්‍රම භාවිතා කිරීම යි.

“වෙළෙඳපොළ ව්‍යාජ ලෙස හැසිරවීම” ලෙස පොදුවේ හඳුන්වන මෙම අපරාධ කාණ්ඩය අතුරින් වැදගත් වරදවල් දෙකක් වන්නේ 130 සහ 131 වගන්ති වල දක්නට ලැබෙන වරදවල් දෙකයි. 130 වෙනි වගන්තිය මඟින් කිසියම් පුද්ගලයෙකු වෙළෙඳපොළ මිල හෝ සුරැකුම්පත් පරිමාව ඉහළ නැංවීමේ හෝ අඩු කිරීමේ බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති, ව්‍යාජ හෝ නොමඟ යවනසුළු ප්‍රකාශයක් සිතා මතා සිදු කිරීම හෝ තොරතුරක් බෙදාහැරීම වලක්වන අතර 131 වගන්තිය මඟින් පුද්ගලයෙකු කිසියම් නොමඟ යවන සුළු, වංචනික හෝ රැවටිලිකාර අනාවැකියක් ප්‍රකාශ කිරීමෙන් හෝ වෙනත් පුද්ගලයෙකු වෙළෙඳාමට පොළඹවා ගැනීමට පෙළඹවීම හෝ උත්සාහ කිරීම වලක්වාලනු ලබයි.

තහනම් කර ඇති හැසිරීම් මොනවාද යන්න ඉතාමත් පැහැදිලි ලෙස සඳහන් කර ඇත. එබැවින් මෙම කොටස යටතේ වරදක් සිදු කර ඇති බවට තහවුරු කිරීම සඳහා තිබිය යුතු සාධක හෝ ගුණාංග මොනවාද යන්න තේරුම් ගැනීම අපහසු නැත.

2 වන පරිච්ඡේදයෙන් අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම ගැන විස්තර ඇතුළත් කර ඇත. යම් පුද්ගලයෙක් ‘අභ්‍යන්තරිකයෙක්’ ලෙස සැළකෙන්නේ කුමන අවස්ථාවකදීද යන්න පැහැදිලිව නිර්වචනය කර ඇති අතර එවැනි පුද්ගලයෙකුට තහනම් කර ඇති දේ මොනවාද යන්න නිශ්චිතව දක්වා ඇත. ඊට අමතරව, එවැනි තොරතුරු සාමාන්‍යයෙන් ලබා ගත හැකි වන්නේ කෙසේද, තොරතුරු ලෙස සැළකෙන්නේ කුමක්ද, සුරැකුම්පත් වල මිලට හෝ වටිනාකමට වැදගත් ලෙස බලපාන තොරතුරු මොනවාද, තොරතුරු සන්තකයේ ඇතැයි සැළකෙන අවස්ථා මොනවාද, සහ අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීමේ චෝදනාවකට අදාළව ඇති සුවිශේෂී ව්‍යතිරේක සහ නිදහසට කරුණු මොනවාද යන්න ඉතා පැහැදිළි ලෙස විස්තර කර ඇත.

උද්ගතවිය හැකි කිසියම් අවිනිශ්චිත භාවයක් හෝ අපැහැදිලි බවක් ඉවත් කිරීමේ අරමුණින් සහ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වන්නන්ට අවසර දී ඇත්තේ කුමන හැසිරීම් සඳහාද සහ තහනම් කර ඇත්තේ කුමන හැසිරීම් ද යන්න පිළිබඳව දැනුවත්භාවයක් ඇතිකිරීමේ අරමුණින් මෙම විධිමත් ප්‍රතිපාදන ඇතුළත් කර ඇත. තවද, එවැනි ඕනෑම වරදක් සිදු කිරීමට අදාළව දැඩි දඬුවම් පැනවීමෙන් අවධාරණය කරනුයේ වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ ක්‍රියාකාරකම් දුෂ්කර කිරීමේ හෝ අධෛර්යමත් කිරීම නොවන අතර වරදවල් සිදුකිරීම මැඩපැවැත්වීමයි.

පෙර පැවති පනත යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා ගොනු කළ යුතුව තිබූ නමුත් මෙතැන් සිට මෙම වරදවල් මහාධිකරණයේදී විභාග කිරීමට නියමිතය. එවැනි වරදකට වරදකරු වන ඕනෑම අයෙකුට රුපියල් මිලියන දහයකට නොඅඩු දඩයක් හෝ අවුරුදු 10 නොඉක්මවන සිර දඬුවමක් හෝ එවැනි දඩයක් හා සිර දඬුවම් යන දෙකම පැනවීමට හැකියාවක් ඇත.

## නඩු පැවරීමේදී කොමිසම සතු බලතල සහ අභිමතයන්

### අපරාධ නඩු කටයුතු

කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන විමර්ශන අවසන් කිරීමෙන් පසුව, V කොටස යටතේ වරදක් සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි පවතින බව කොමිසමේ අදහස වන්නේ නම් අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීමට පියවර ගනු ඇත. අපරාධ නඩු විභාගය මහාධිකරණයේ සිදුකළ යුතු හෙයින් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ (අල්ලස් පනතේ දක්වා ඇති ව්‍යතිරේකයට යටත්ව) දක්වා ඇති පරිදි නීතිපතිවරයාට පමණක් ඉදිරිපත් කළ හැකි ‘අධිචෝදනා පත්‍රයක්’ යටතේ චෝදනා ගොනු කෙරේ. එලෙස අධිචෝදනා පත්‍රය ගොනු කිරීම සඳහා කොමිසම නීතිපතිවරයා වෙත යොමු කරන අතර පැමිණිල්ල මෙහෙයවීම නීතිපතිවරයා විසින් සිදු කරනු ඇත. පෙර පනත යටතේ සියලුම වරදවල් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයට චෝදනා ගොනු කිරීමට නියමිතව තිබියදීත්, චෝදනා සකස් කිරීම සහ පැමිණිල්ල මෙහෙයවීම නීතිපතිවරයා විසින් සිදු කරන ලදී.

V කොටසේ අඩංගු කරුණු හැර අනෙකුත් වරදවල් මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග කළ යුතු වේ.

### සිවිල් නඩු කටයුතු

නව පනතින් හඳුන්වා දී ඇති නව අංගයක් වන්නේ අලාභ අයකර ගැනීම සහ සිවිල් දණ්ඩනයක් පැනවීම සඳහා වාණිජ මහාධිකරණය ලෙස පොදුවේ හැඳින්වෙන සිවිල් අධිකරණ බලය ඇති මහාධිකරණය ඉදිරියේ සිවිල් නඩු කටයුත්තක් ආරම්භ කිරීම සඳහා කොමිසම වෙත පැවරී ඇති අභිමතයයි. මෙම පනත මඟින් වාණිජ මහාධිකරණයට මෙම අධිකරණ බලය විශේෂයෙන් පවරා ඇත. V කොටස යටතේ වරදක් සිදු කළ පුද්ගලයෙකුට එරෙහිව එවැනි නඩු කටයුත්තක් පැවරිය හැකිය. එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධව කොමිසමේ තීරණය රඳා පවතින්නේ උල්ලංඝනය කිරීමේ ස්වභාවය සහ ආකාරය, එය වෙළෙඳපොළ කෙරෙහි ඇති කරන බලපෑම සහ ආයෝජකයෙකුට සිදු වී ඇති අලාභයේ ප්‍රමාණය මතයි. කොමිෂන් සභාව විසින් අයකර

ගත හැකි අලාභ මුදල වන්නේ ලැබුණු ලාභය හෝ වලක්වාගත් අලාභය මෙන් තුන් ගුණයක් වන අතර උල්ලංඝනය කිරීමේ බරපතලකම හා ප්‍රමාණය අනුව අධිකරණයට පැනවිය හැකි දණ්ඩනය රුපියල් මිලියන දහයකට නොඅඩු විය යුතු අතර රුපියල් මිලියන සියයකට වඩා නොවැඩි විය යුතුය.

V වෙනි කොටස යටතේ ඇති වන උල්ලංඝනය කිරීම් වලදී උපයාගත් මුදල්මය ලාභයේ හෝ වළක්වා ගත් අලාභයේ දළ ප්‍රමාණය මෙන් තුන් ගුණයකට සමාන මුදලක් ගෙවීමට වගකීම පිළිගැනීමකින් යුක්තව හෝ නොමැතිව ඕනෑම පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමේ අභිමතය ද කොමිසමට පැවරී ඇත. V වැනි කොටස යටතේ දක්වා ඇති වරදවල් හැර වෙනත් වරදවල් සඳහා එවැනි වරදකට ලබාදිය හැකි උපරිම දඩ මුදලින් අඩක් නොඉක්මවන මුදලක් අය කර ගෙන සමථයකට පත් කිරීමේ හැකියාවක් ඇත.

### පරිපාලන දණ්ඩනයන්

මෙම පනත මගින් හඳුන්වා දී ඇති තවත් වැදගත් දෙයක් වන්නේ 'පරිපාලන දණ්ඩනයන්' පැනවීමට කොමිසමට ඇති හැකියාවයි. වර්තමානයේදී, සියලු කඩකිරීම් අපරාධ වරදවල් ලෙස සළකනු ලැබුවද, දඩයක් හෝ වෙනත් පරිපාලන දණ්ඩනයන් පැනවීම සඳහා කොමිසමට පැහැදිලි බලයක් තිබුණේ නැත.

කෙසේ වෙතත්, මෙම විධිවිධානය මඟින් "උල්ලංඝනයේ ස්වභාවය සහ ආකාරය, අනුකූල නොවීම හෝ උල්ලංඝනය වීම සහ එහි බලපෑම" සැළකිල්ලට ගනිමින් කොමිෂන් සභාවේ අභිමතය පරිදි (V කොටස යටතේ ඇති වරදවල් හැරුණු විට) තරවටු කිරීම, දණ්ඩනයක් පැනවීම, ආපසු අයකර ගැනීම, තහනම් නියෝගයක් පැනවීම හෝ ගණුදෙනු තහනම් කිරීම වැනි විවිධාකාර පරිපාලන දණ්ඩනයන් යම් පුද්ගලයෙකු මත පැනවිය හැකිය.

### ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා වන පියවර සහ අධිකරණය වෙතින් යම් නියෝග ලබා ගැනීමේ අයිතිය

ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම උදෙසා කොමිසමට යම් යම් පියවර ගැනීමට ඇති හැකියාව සහ විමර්ශන ක්‍රියාවලියේදී යම් නියෝග නිකුත් කිරීම සහ (දින හතක කාලයක් සඳහා වලංගු වන අනතුරුව වාණිජ මහාධිකරණය විසින් තහවුරු කළ යුතු) අවුරා තැබීමේ නියෝග නිකුත් කිරීමේ හැකියාව හඳුන්වාදීම තවත් විශේෂාංගයක් වේ. යම් කඩකිරීමක් සිදුකර ඇති අවස්ථාවක හෝ කඩකිරීමක් සිදු විය හැකි බවට විශ්වාස කරන අවස්ථාවකදී කොමිසම හට මහාධිකරණය ඉදිරියට ගොස් යම් සුරැකුම්පත් ගණුදෙනුවක් බල රහිත ලෙසට හෝ යම් සුරැකුම්පත් ගණුදෙනුවක් සිදු කිරීම වලක්වන ලෙසට නියම කෙරෙන නියෝගයක් ලබාගැනීමට හැකියාවක් ඇත.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා වැදගත් වන ප්‍රතිපාදන

වෙළෙඳපොළේ දියුණුවට දායක වන ප්‍රතිපාදන බොහෝමයක් නව පනතේ ඇත. වත්කම් කැපකිරීමේ අවදානම බොහෝ සෙයින් අවම කරන සහ නව ගනුදෙනු උපකරණ හඳුන්වා දීමට ද හැකි වන පරිදි, මධ්‍යම ප්‍රති-පාර්ශවය වැනි අති නවීන යටිතල පහසුකම් භාවිතයට ඉඩ සළසා දී ඇත. ව්‍යුත්පන්නවල ආයෝජනය කිරීම (සළකා බලන වත්කමේ ස්වභාවය නොතකා අනාගතයන් සහ වරණයන් වැනි), කොටස් ණයට ගැනීම සහ ණයට දීම සහ නියාමනයට යටත් හිඟ විකුණුම් යනාදිය හඳුන්වාදීම සඳහා ප්‍රතිපාදන ද ඇතුළත් කර ඇත. මෙමගින් වෙළෙඳපොළේ ද්‍රවශීලතා මට්ටම ඉහළ නංවන අතර දැනට පවතින ඒක පාර්ශවීය තත්ත්වය ඉවත් කර ප්‍රබල වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට උපකාරී වේ. මෙවැනි අවස්ථාවලින් දිගු කාලීන ආයෝජකයින්ට අවස්ථා ලැබෙනු ඇත.

ලයිස්තුගත නොකළ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම සඳහා පහසුකම් සැළසෙන අතර ඒ සඳහා අතිරේක ගණුදෙනු වේදිකාවක් ද නිර්මාණය කිරීමේ හැකියාව ඇත. වෙළෙඳපොළ සාදන්නන්ට වෙළෙඳපොළ අතරමැදියෙකු ලෙස කටයුතු කිරීමට ඇති හැකියාව තුළින් ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතර සුරැකුම්පත් අඛණ්ඩව හා කාර්යක්ෂමව හුවමාරු කර ගැනීම සහතික කෙරේ. මෙමඟින් වෙළෙඳපොළ පුළුල් වන අතර විනිමය හුවමාරු අරමුදල් වැනි අරමුදල් පිහිටුවීම ද දිරිමත් කෙරෙනු ඇත.

තවද, නව පනත මඟින් ලොව පුරා පිළිගත් ප්‍රවණතාවයන්ට අනුකූල වන සුරැකුම්පත් ඇතුළත් කිරීමට හැකි වන පරිදි 'සුරැකුම්පත්' යන්න නැවත අර්ථ දක්වා ඇත. ඒ හා සමානව, ඒකක භාරයෙන් ඔබ්බට ගිය 'සාමූහික ආයෝජන යෝජනා ක්‍රම'



සඳහා ද ප්‍රතිපාදන සකසා ඇත. මෙම කාණ්ඩය යටතට ගැනෙන්නේ මොනවාද යන්න නිර්වචනය කර ඇත. මෙතුළින් නව ආයෝජන අවස්ථා සැළසෙනු ඇත.

දැනට වෙළෙඳපොළේ ඇති ගනුදෙනු උපකරණ පරාසය පුළුල් කිරීම සඳහා ‘පිළිගත් ආයෝජකයින්’ ලෙස පුද්ගල කාණ්ඩයක් හඳුනාගෙන ඇත. මෙමඟින් සුළු පරිමාණ ආයෝජකයින්ට ආරක්ෂාව ලැබෙනවා පමණක් නොව, ඉහළ අවදානම් දැරීමට හැකි තත්ත්වයේ සිටින අය විසින් ප්‍රයෝජනයට ගත හැකි අධි අවදානම් සහිත ආයෝජන උපකරණ වෙළෙඳපොළට නිකුත් කිරීමට ද හැකි වනු ඇත.

වෙළෙඳපොළේ අක්‍රමිකතා මැඩපැවැත්වීම පහසු කරනු ඇතැයි යන අපේක්ෂාවෙන් ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම සඳහා වූ විධිවිධාන ඇතුළත් කර ඇත. මෙම ආරක්ෂාව නිෂ්ඵල ඉල්ලීම් සිදුකරමින් අනිසි ලෙස භාවිතා නොකිරීමට වගබලා ගැනීම වැදගත් වන අතර, එවැනි පද්ධතියකින් ලබා ගත හැකි ප්‍රතිලාභ අවතක්සේරු නොකළ යුතුය.

## කොමිෂන් සභාවේ බලතල හා අභිමතය තුලනය කිරීම සඳහා අන්තර්ගත කර ඇති දේ

නියාමකයෙකු ලෙස එහි කාර්යයන් වඩාත් අර්ථවත් හා ඵලදායි ලෙස ඉටු කළ හැකි බව සහතික කිරීම සඳහා නව පනත යටතේ කොමිසමට පුළුල් බලතල හා අභිමතයක් පැවරී ඇත. කෙසේ වෙතත් මතක තබා ගත යුතු විශේෂ කරුණක් වන්නේ කොමිසම හට මුක්තියක් ලබා දී නොමැති බවත්, බලය හා අභිමතය පවරා ඇති වෙනත් ඕනෑම මහජන අධිකාරියක් මෙන්ම කොමිසමද නීතියට අනුව එවැනි බලය හා අභිමතය පාවිච්චි කළ යුතු බවත්, සෑම අවස්ථාවකදීම ස්වාභාවික යුක්ති මූලධර්ම අනුගමනය කළ යුතු බවත්ය. කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය සහ අභිමතය තුලනය කිරීම උදෙසා යම් සීමාවන් පනවා ඇති අතර එමඟින් කොමිෂන් සභාවේ වගවීම හා කිසිදු අවස්ථාවක එහි අධිකාරිය නොඉක්මවන ආකාරයට කටයුතු කරන බව සහතික කෙරෙනු ඇත.

කොමිෂන් සභාව තීරණයක් ගැනීමට පෙර අනෙක් පාර්ශවයට ඇහුම්කන් දිය යුතු බව, අභියාචනා කිරීමේ අයිතිය ලබා දීම, කොමිසම විසින් යම් තීරණ ගැනීමේදී එකී තීරණය සඳහා හේතු දැක්විය යුතු බවට වන සඳහන් කිරීම් මෙම සීමාවන් ලෙසට හැඳින්විය හැක. එමෙන්ම කොමිසම අධිකරණය ඉදිරියට ගොස් යම් නියෝග ලබා ගත යුතු බවට දක්වා ඇති ප්‍රතිපාදන සහ එවැනි නියෝග ලබාදීමට පෙර අධිකරණය අනෙක් පාර්ශවයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදිය යුතු බවට වන ප්‍රතිපාදන ද සාධනීය ඒවා ලෙස දැක්විය හැකිය.

තවද, අභියාචනාධිකරණයේ රිට් අයදුම්පත්‍රයක් ගොනු කිරීම මඟින් කොමිසමේ තීන්දුවක් අභියෝගයට ලක් කිරීම සඳහා වූ පොදු නීතිය ඉදිරියේ ඇති අයිතිය මෙම පනතින් නැවත අවධාරණය කර ඇති අතර එමඟින් අගතියට පත් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් ව්‍යවස්ථාපිතව තහවුරු කර ඇත.



## අවසන් කිරීම

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ප්‍රගතිශීලී විධිවිධාන මඟින් ප්‍රාග්ධන වෙළෙඳපොළක අවසාන ඉලක්කය ලෙස සැළකෙන සියළුම වෙළෙඳපොළ සහභාගීවන්නන් තුළ විශ්වාසයක් ඇති කිරීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල නියැලීමට අවශ්‍ය පරිසරය ගොඩනැගීම සඳහන් කළ හැක. වෙළෙඳපොළ නියාමකයා වශයෙන් කොමිෂන් සභාව අධික ලෙස නියාමනය කිරීම සුදුසු නොවන බවට දැනුවත් අතර එම නිසා සෑම විටම නිවැරදි සමතුලිතතාවය ඇති කර ගැනීමට කැපවී සිටිය යුතුය. ඒ අතරම, සෑම වෙළෙඳපොළ සහභාගිවන්නෙකුම ස්වයං නියාමනයක් පිළිපදින්නේ නම් සහ නීතියේ සීමාවන් තුළ ක්‍රියා කරන්නේ නම්, මෙම පනතේ අඩංගු බොහෝ විධිවිධාන ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනඟින බව ද අවධාරණය කළ යුතුය.

Follow us on:

Telephone : +94 11 2143843
Fax : +94 11 2439149
Email : mail@sec.gov.lk

www.sec.gov.lk